<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි පෙර පාසල් පාලිකා තනතුරු සඳහා වන</u>
<u>බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය - සංශෝධන අංක 02</u>

| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 9.2.3.2 | උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි | 9.2.3.2 | උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි | දැනට පවත්නා වයස් සීමාව තුළ බඳවා ගැනිම සඳහා ප්‍රමාණවත් පරිදි අයදුම්පත්‍ර නොලැබීම. |
| 16.2 | මෙම පරිපාටිය අනුමත වන දිනට පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සහ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ඛාණ්ඩයන්ට අදාලව ස්ථිර පත්වීම් ලබා ඇති එහෙත් පෙර පාසල් පාලිකා තනතුරුවල සේවයේ යොදවා ඇති සේවක මහත්මීන් මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට පෙර පාසල් පාලිකා III ශ්‍රේණියට පත් කරනු ලැබේ.<br><br>පෙර පාසල් පාලිකා තනතුරුවලට අදාල සේවය සඳහා යොදා ගත්තේද යන්න සභාවේ නාගරික කොමසාරිස් හෝ ලේකම් වෙතින් ගෙන්වා ගනු ලබන වාර්තාවක් මගින් සනාථ කර ගනු ලැබේ. එලෙස පත්කරනු ලබන III ශ්‍රේණියේ පෙර පාසල් පාලිකාවන් වසර තුනක් ඇතුලත මෙම පටිපාටියේ 9.3.2.2. හි සඳහන් වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කරගත යුතු වේ. එසේම වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට අපොහොසත් වුවහොත් වසර තුන (03) අවසානයේ පෙර දැරූ තනතුරට පෙරලා යවනු ලැබේ.<br><br>ඉහත අන්තර්කාලීන විධිවිධාන එක් වරකට පමණක් සීමා විය යුතුය. | 16.2 | මෙම පරිපාටිය අනුමත වන දිනට පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සහ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ඛාණ්ඩයන්ට අදාලව ස්ථිර පත්වීම් ලබා ඇති එහෙත් පෙර පාසල් පාලිකා තනතුරුවල සේවයේ යොදවා ඇති සේවක මහත්මීන් මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දින සිට පෙර පාසල් පාලිකා III ශ්‍රේණියට පත් කරනු ලැබේ.<br><br>පෙර පාසල් පාලිකා තනතුරුවලට අදාල සේවය සඳහා යොදා ගත්තේද යන්න සභාවේ නාගරික කොමසාරිස් හෝ ලේකම් වෙතින් ගෙන්වා ගනු ලබන වාර්තාවක් මගින් සනාථ කර ගනු ලැබේ. එලෙස පත්කරනු ලබන III ශ්‍රේණියේ පෙර පාසල් පාලිකාවන් වසර තුනක් ඇතුලත මෙම පටිපාටියේ 9.3.2.2. හි සඳහන් වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කරගත යුතු වේ. එසේම වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට අපොහොසත් වුවහොත් වසර තුන (03) අවසානයේ පෙර දැරූ තනතුරට පෙරලා යවනු ලැබේ.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-03-28 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක CPC/PSC/32/3/2017 හා 2021.11.01 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව පළාත් පාලන ආයතනවල දැනටමත් වෙනත් ප්‍රාථමික තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන් පෙර පාසල් ගුරු තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා විධිවිධාන හා ඔවුන් විශ්‍රාම ගැන්වීමට අදාළ විධිවිධාන ඇතුළත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 16.3.1 | දැනට පවතින පෙළක් නොමැත. | 16.3.1 | උපලේඛනය vi මගින් දක්වා ඇති පළාත් පාලන ආයතනවල පවතින පෙර පාසල් පාලිකා තනතුරෙහි පුරප්පාඩු සඳහා මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දිනය වන 2019.10.16 වන විට අදාල පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සහ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ඛාණ්ඩයන්ට අදාලව ස්ථිර පත්වීම් ලබා ඇති එහෙත් පෙර පාසල් පාලිකා තනතුරුවල සේවයේ යොදවා ඇති වෙනත් ස්ථිර තනතුරු දරණ සේවිකාවන් සේවය කරන බැවින් ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, සේවා කාලය, වෘත්තීය සුදුසුකම් සමඟ සේවා කාලයේ ප්‍රමුඛතාවය අනුව සළකා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය අනුව අදාළ පළාත් පාලන ආයතන වෙත පෙර පාසල් පාලිකා පත්වීමක් ලබා දී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. ඔවුන් පෙර පාසල් පාලිකා තනතුරුවලට අදාළ සේවය සඳහා යොදා ගත්තේද යන්න සභාවේ නාගරික කොමසාරිස් හෝ ලේකම් වෙතින් ගෙන්වා ගනු ලබන වාර්තාවක් මගින් සනාථ කරගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පරිපාටිය උපලේඛන vii හි පරිදි විය යුතුය. | |
| 16.3.2. | දැනට පවතින පෙළක් නොමැත.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 03 - 28 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | 16.3.2. | මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ අන්තර්කාලීන විධිවිධාන යටතේ දැනටමත් සේවයට අන්තර්ග්‍රහණය කර ඇති හා ඉහත 16.3.1 පරිදි සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සේවිකාවන්ට පුද්ගලික වන සේ එසේ අන්තර්ග්‍රහණය කරන ලද දින සිට වසර තුනක (03) කාලයක් ඉක්මවා යාමට පෙර අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹ විශ්‍රාම යන්නේ නම් මෙම ව්‍යවස්ථාවේ 9.3.2.2 හි සඳහන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීම පිළිබඳව නොසළකා ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>ඉහත අන්තර්කාලීන විධිවිධාන එක් වරකට පමණක් සීමා විය යුතුය. | |

## උපලේඛනය vii

පහත සඳහන් පළාත් පාලන ආයතනවල පෙර පාසල් පාලිකා තනතුරෙහි පුරප්පාඩු සඳහා වෙනත් ස්ථිර තනතුරු දරණ සේවිකාවන් සේවය කරන බැවින් ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, සේවා කාලය, වෘත්තීය සුදුසුකම් සමඟ සේවා කාලයේ ප්‍රමුඛතාවය අනුව ද බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | පෙර පාසල් පාලිකා අනුමත තනතුරු සංඛ්‍යාව | පෙර පාසල් පාලිකා පුරප්පාඩු සංඛ්‍යාව | ප්‍රාථමික සේවයේ සේවක සංඛ්‍යාව | අන්තර්ග්‍රහණය කරනු ලබන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව | 03 | 02 | 03 | 02 |
| 02. | පූජාපිටිය ප්‍රාදේශීය සභාව | 04 | 04 | 07 | 04 |
| 03. | පාතදුම්බර ප්‍රාදේශීය සභාව | 02 | 01 | 02 | 01 |
| 04. | තලවකැලේ දිඹුල නගර සභාව | 02 | 02 | 03 | 02 |
| 05. | නුවරඑළිය මහනගර සභාව | 02 | 01 | 09 | 01 |
| 06. | අඹගමුව ප්‍රාදේශීය සභාව | 01 | 01 | 03 | 01 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 28 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

උපලේඛනය viii

පෙර පාසල් පාලිකා තනතුරට තෝරා ගැනීම සඳහා අදාළ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ප්‍රධාන නිර්ණායක තුනක් පවතින අතර, ඒ සඳහා පහතින් දක්වා ඇති පරිදි මුළු ලකුණු 100 ක් ලබා දීම සිදු වේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන්නන් විසින් ලබා ගනු ලබන මුළු ලකුණු සළකා වැඩිම ලකුණු ලබා ගත් පිළිවෙල සැළකිල්ලට ගෙන සුදුස්සන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

<u>ප්‍රධාන නිර්ණායක</u>

| | |
|---|---|
| 01. අධ්‍යාපන සුදුසුකම් (අධ්‍යයන පොදු සහතිකපත්‍ර සා/පෙළ විභාගය හා අධ්‍යයන පොදු සහතිකපත්‍ර උ/පෙළ විභාගය) | - 42 |
| 02. වෘත්තීය සුදුසුකම් | - 35 |
| 03. පෙර පාසලක අඛණ්ඩව සේවය කළ සේවා කාලය | - 23 |
| | 100 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 2? දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

## <u>සම්මුඛ පරීක්ෂණ ව්‍යුහය හා ලකුණු ලබා දීමේ පිළිවෙළ</u>

01. අධ්‍යාපන සුදුසුකම්.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය
  අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් හයකින් සමත්වීම අවම සුදුසුකම ලෙස සළකා අදාල ඉල්ලුම්කාරිනියන් විසින් ලබා ගෙන ඇති ඉතිරි ප්‍රතිඵල සළකා කටයුතු කරනු ලැබේ.

| ප්‍රධාන නිර්ණායකය | ලකුණු ලබා දීමේ නිර්ණායක | ලබාදෙන ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්**<br>(අධ්‍යයන පොදු සහතිකපත්‍ර සා/පෙළ) ගණිතය/භාෂාව(සිංහල/දෙමළ)/සෞන්දර්ය විෂය (චිත්‍ර/නැටුම්/සංගීතය) සඳහා ලබා ගත් සාමාර්ථය<br>ගණිතය, භාෂාව, සෞන්දර්ය විෂයන් සඳහා ලකුණු ලබා දීමේදී එම විෂයන් සඳහා වන ප්‍රතිඵල ලේඛණ විභාග වාර කිහිපයකදී ලබාගෙන තිබෙන අවස්ථාවකදී වාර දෙකක් පමණක් සළකා බලනු ලබන අතර, ඉන් ඉහළම සාමාර්ථයක් ලබා ගෙන ඇති ප්‍රතිඵල ලේඛණය සළකා ලකුණු ලබා දෙනු ලැබේ. එමෙන්ම අවම සුදුසුකම් සහිත අවස්ථාවක ඒ සඳහා මෙම විෂයන් ඇතුළත්ව පවතී නම් ඒ සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.. | විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා | 4 | 12 |
| | අධි සම්මාන සාමාර්ථයක් සඳහා | 3 | |
| | සම්මාන සාමාර්ථයක් සඳහා | 2 | |
| | සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | 1 | |
| අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී අවම සුදුසුකමට (විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් හයකින් සමත්වීම) අමතරව හා ගණිතය, සිංහල/දෙමළ,සෞන්දර්ය විෂයන්ටද අමතරව යම් විෂයකින් සමත්ව සම්මාන ලබා ඇත්නම් එම විෂයන් සඳහා ලබා ගත් සාමාර්ථ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා | 4 | 12 |
| | අධි සම්මාන සාමාර්ථයක් සඳහා | 3 | |
| | සම්මාන සාමාර්ථයක් සඳහා | 2 | |
| | සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | 1 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 28 .... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

| ප්‍රධාන නිර්ණායකය | ලකුණු ලබා දීමේ නිර්ණායක | ලබා දෙන ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය<br><br>(අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් ලබා ගත් ප්‍රවීණතාවය සම්බන්ධයෙන් සළකා බැලිය යුතුය. මෙහිදී ඇය විභාග අවස්ථා කිහිපයක් සඳහා පෙනී සිට ඇත්නම් එයින් මුල් වාර දෙක සළකා බලන අතර එහිදී ලබා ගත් ප්‍රතිඵල ලේඛන අතරින් ඉහළ ප්‍රවීණතාවයක් ලබා ගෙන ඇති ප්‍රතිඵල ලේඛනය සළකා ලකුණු ලබා දෙනු ලැබේ.) | විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා | 4.5 | 18 |
| | අධි සම්මාන සාමාර්ථයක් සඳහා | 4 | |
| | සම්මාන සාමාර්ථයක් සඳහා | 3 | |
| | සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | 2 | |

**02.** වෘත්තීය සුදුසුකම්.

| ප්‍රධාන නිර්ණායකය | ලකුණු ලබා දීමේ නිර්ණායක | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් වෘත්තීය සුදුසුකම් (පෙර පාසල් ක්ෂේත්‍රය පිළිබඳව)<br><br>පෙර පාසල් ක්ෂේත්‍රය පිළිබඳ රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් වෘත්තිය සුදුසුකම් සළකා බැලිය යුතු අතර, එම ලබා ගත් සුදුසුකම් සැළකීමේදී උපරිම ප්‍රවීණතාවය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | සහතික පත්‍ර පාඨමාලාව<br>(පාඨමාලා කාලය වසරක් හෝ ඊට වැඩි) | 10 | 35 |
| | උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>(පාඨමාලා කාලය වසරක් හෝ ඊට වැඩි) | 20 | |
| | ඩිප්ලෝමා පාඨමාලාව<br>(පාඨමාලා කාලය වසරක් හෝ ඊට වැඩි) | 35 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022-03-28 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**03.** පෙර පාසලක අඛණ්ඩව සේවය කළ සේවා කාලය.

| ප්‍රධාන නිර්ණායකය | ලකුණු ලබා දීමේ නිර්ණායක | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| පළාත් පාලන ආයතනයක් යටතේ පවතින පෙර පාසලක අනියම් හෝ ස්ථිර පදනමින් අඛණ්ඩව සේවය කල සේවා කාලය සලකා බැලිය යුතු අතර, අවම සේවා කාලය අවුරුදු 03 ක් ලෙස සැළකිය යුතුය. | අවු. 03 සිට 05 දක්වා | 3 | 23 |
| | අවු. 05 සිට 10 දක්වා | 8 | |
| | අවු. 10 සිට 15 දක්වා | 13 | |
| | අවු. 15 වැඩි | 23 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 28 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : - නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..............................

02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................

05. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

06 ජේ.ඩී.කේ. වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................

07. පී.ටී.ජී. ගුණතිලක මයා (සාමාජික) ..............................

දිනය 2022/03/15

ආණ්ඩුකාර ලේකම්,

2022/03/15 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2022/335 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි පෙර පාසල් පාලිකා තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 02 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2022-03-21

..............................
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත

2022-03-28